# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# සංගීතය

# 10 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**
පී.ඩී. ඉරෝෂිනි කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**
ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**
අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**
පාලිත වික්‍රමපාල - ගුරු උපදේශක

සමන්තා අමුණුගම - ගුරු සේවය

**සියලු හිමිකම් ඇවිරිණි**

## දේශීය සංගීතඥයෝ

### ➢ ඩබ්ලිව්.බී මකුලොලුව ශූරීන්



ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා මහනුවර - හාරිස්පත්තුවේ "ඉඩමේගම" නම් ගමෙහි 1922 පෙබරවාරි මස 17 දින උපත ලැබීය. සාමාන්‍ය ගුරුවරයෙකු ලෙස කලක් සේවය කළ මෙතුමා නැටුමට හා සංගීතයට ඇති ආශාව නිසා ශාන්ති නිකේතනයේ දක්ෂ ලෙස අධ්‍යාපන කටයුතු නිමකර ඇත. රවින්ද්‍රනාත් තාගෝර්තුමාගේ පා සෙවනෙහි සිතාර් වාදනය හා එස්රාජ් වාදනය ප්‍රගුණකළ විද්වතෙකි. මෙතුමා සංගීතයට ඉටුකළ සේවාවන් අතිමහත්ය. ජන ගී රූසක එකතුවක් ලෙස "හෙළගී මඟ" ප්‍රබන්ධයෙහි නිර්මාතෘවරයා වන මෙතුමා "දෙපාණෝ" ගීත නාට්‍යයත්, "හෙළ මිහිර" , "ගොයම් දා මඟුල" යන සංගීත නිර්මාණ රූසක හෙළ ජන ගී නාද රටා මුසු කර ගනිමින් නිර්මාණයෙහි යෙදුනේ ය.

### ➢ රෝහණ බැද්දගේ ශූරීන්



1935 නොවැම්බර් මස 01 දින රයිගම් කෝරලයේ උඩුව නම් ගමෙහි උපත ලැබීය. ජන සංගීතය සඳහා මූලික අධ්‍යාපන පියය වූයේ ඔහු උපන් ගම්මානයයි. ගමේ කෝළම් නැටුම් කණ්ඩායමටත් පහත රට නැටුම් හා සම්බන්ධ වෙමින් බෙරවාදනය කිරීමටත් දක්ෂ විය. ගොවිතැනේදී යොදාගන්නා ගොයම් කැපීම, අඹහැර පෑම, පැල්කවි ගායනය එතුමාගේ කලා ජීවිත අධ්‍යාපනයේ මූලික අඩිතාලම විය. එතුමාගේ සංගීත ගුරුවරුන් වූවෝ ඩබ්.ඩී.අමරදේව, බී.වික්ටර් පෙරේරා වැනි ශ්‍රේෂ්ඨ සංගීතඥයෝය. 1959 දී නැටුම් ගුරුවරයෙකු ලෙස රජයේ සේවයට බැඳුනේය. ජන ශ්‍රැතිය, ජන නාද රටා රිද්මය මනාසේ හඳුනාගනිමින් නිර්මාණකරණයේ යෙදෙන මෙතුමා රංගනය, නර්තනය, ගායනය, සංගීත අධ්‍යක්ෂණය, නාට්‍ය නිෂ්පාදනයේ සුවිශේෂී හැකියා ඇතිව උපන්නෙකි. "දෑසමන් මලක් වගෙයි, සකිය සගව්වට, දන්නා තරම් - පද කස්තිරම්" වැනි ගීත සදා අමරණීය වේ. "ගම්මානේ උපන් ගීත" මෙතුමාගේ කෘතියකි.

### ➢ ලයනල් රංවල ශූරීන්



වර්ෂ 1939 නොවැම්බර් 27 දින උපත ලැබීය. සංගීත ගුරුවරයෙකු ලෙස 1959 දී ඇරැව්වල මහා විද්‍යාලයේ දී වැඩභාර ගනු ලැබීය. 1964 දී පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ සංගීත ගුරුවරයා සේවය කරන අතරතුර හේවිසි තූර්ය වාදක කණ්ඩායමක් ආරම්භ කරන ලදී. දක්ෂ ගායකයෙකු නිරූපණ ශිල්පියෙකු වාදන ශිල්පියෙකු වන මොහු ලංකාවේ ප්‍රථම ඔපෙරාව වූ මකුලොලුව මහතාගේ "දෙපානෝ" ගීත නාටකයෙහි රංගනයෙහිද යෙදුණි. සිංහල ජන ගීයට ඇළුම් කළ දේශීය සංගීතඥයින් අතර නූතන රසිකත්වය ද, ආකර්ෂණීය කරගත් සුවිශේෂී ගායකයෙකි. සංගීත නිර්මාණකරුවෙකි."දෙපාණෝ" නාට්‍යයේ රංගනයේ යෙදෙමින් සිය අවසන් ටෙලිනාට්‍යය වන "රඟ මඬල සමුගනී" සමඟම ජීවිතයෙන් සමුගත් මෙතුමාගේ "ගම අවුලක්ඤ0 " "මේ අවුරුදු කාලේ" වැනි ගී අස්වාදජනක ය.


### ➢ සී.ද ඇස්. කුලතිලක ශූරීන්



1926 දෙසැම්බර් 14 දින අම්බලන්ගොඩ පොල්වත්තේ සඳමැදුරේදී උපත ලැබුවේය. 1948 දී තෙල්දෙණිය මහා විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස සේවය කල මෙතුමා 1952 දී භාරතයේ ශාන්ති නිකේතනයට ඇතුලත් විය. 1970 දී ශ්‍රී ලංකා ගුවන්විදුලියේ සංගීත පර්යේෂණ අංශ ප්‍රධාන තනතුරට පත්විය. එමෙන්ම සංගීත නිර්මාණකරුවෙකු වූ මෙතුමා "දැතට වළලු" ගීතයේ මිහිරි ගී තනුවක් ද, නිර්මාණය කිරීමට දායක වුවෙකි. ශ්‍රී ලංකාවේ සංගීත සම්භාව්‍ය, විශ්ව සංගීත ක්ෂේත්‍ර, සංගීත සිද්ධාන්ත නම් ග්‍රන්ථ රාශියක් නිර්මාණය කළේය. 1979 දී සෞන්දර්ය අධ්‍යාපන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කල මෙතුමා 2005 මැයි මස 21 දින අප අතරින් වියෝ වූයේය.


## භාරතීය සංගීතඥයෝ

### ➢ පණ්ඩිත් රවි ශංකර්



1920 අප්‍රේල් 7 වන දින බරණැස දී උපත ලැබූ මොහු රබීන්ද්‍ර ශංකර් චෞද්රි නම් විය. 20 වන සියවසයේ භාරතයේ බිහිවූ ශ්‍රේෂ්ඨතම සංගීතඥයින් අතරින් විශිෂ්ඨ සණයේ සැලකෙන සංගීතඥයෙකි. සිතාර් වාදනයේ අති දක්ෂ මෙතුමා පණ්ඩිත යන සංගීත ගෞරව නාමය හිමිවූ හෙයින් එතැන් පටන් පණ්ඩිත් රවිශංකර් ලෙස තම වාදනයෙන් ලොවම වශීකර ගත්තෙකි. 1970 සිට මෙතුමා ඉන්දීය සංගීතය පිළිබඳ ආරාධිත දේශකයෙකු ලෙස කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ සේවය කළේය. මෙතුමා My music 1968, Learning Indian music 1979, Raga mala 1997 යන කෘති රචනා කරමින් අපවෙත දායාද කළේය. 1986 සිට 1992 තෙක් ඉන්දීය පාර්ලිමේන්තුවේ පත්කළ මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කල මෙතුමා 1990 දී **"භාරත රත්න"** නාමයෙන් පිදුම් ලැබීය. 2012.12.11. දින හදවත් සැත්කමකින් අනතුරුව මෙතුමා අප අතරින් සමුගත්තේය.

### ➢ සංගීතඥ ජග්ජිත් සිං



සික් ජාතික මෙතුමා 1941 පෙබරවාරි මස 8 වන දින ඉන්දියාවේ ශ්‍රී ගංගා නගර් හිදී "ජග් මෝහන් සිං" නමින් උපත ලැබීය. 2003 වසරේදී මොහු ඉන්දියානු රජයෙන් පිදෙන "පද්ම භූෂණ" සම්මානයෙන් ද 2012 වසරේදී "රාජස්තාන් රත්න" සම්මානයෙන්ද පිදුම් ලැබීය. මෙතුමා හින්දුස්ථානි ශාස්ත්‍රීය සංගීතයේ ගසල් ගායනයෙහි ජනප්‍රියත්වය ලැබුවෙකි. ගසල් king යන විරුධාවලියෙන් ද හැඳින්වූ මොහු ඛ්‍යාල්, ධ්‍රැපද් යන ශාස්ත්‍රීය යන ගායන ශෛලීන් ද ප්‍රගුණ කළ කෙනෙකි.

### ➢ පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා



1938 ජුලි 01 වන දින ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ අලහබාද් නගරයේදී උපත ලැබීය. මොහුට අවුරුදු 6 ක් වන විට මොහුගේ මව මියගියාය. මොහුගේ පියා මල්ලවපොර ක්‍රීඩකයෙකි. පියාට අවශ්‍ය වූයේ ඔහුද මල්ලවපොර ක්‍රීඩකයෙකු කිරීමටය. වසර 15 දී පමණ පණ්ඩිත් රාජාරාම්ගෙන් ගායනය හැදෑරීම ආරම්භ කළේය. 1957 දී ක්‍රියාකාරිව සංගීත ක්ෂේත්‍රයට අවතීර්ණ වූ මෙතුමා ඉන්දියානු ගුවන්විදුලියට සම්බන්ධ වූ අතර සංගීත නිර්මාණකරුවකු හා වෘත්තීය වාදකයෙකු ලෙස කටයුතු කළේය. ඉන්දීය ශාස්ත්‍රීය බටනලා වාදකයෙකු වන මෙතුමා බාන්සුරි සහ ඉන්දියන් බටනලා වාදනයෙහි අති දක්ෂයෙකු වූ අතර සංගීත ක්ෂේත්‍රය තුල කරන ලද නිර්මාණ වෙනුවෙන් ඔහු සම්මාන රැසකින් පිදුම් ලැබීය.


- සංගීත් නාටක් ඇකඩමි-1984,
- පද්ම භූෂණ-1992,
- පද්ම විභූෂණ-2000



### ➢ සංගීතඥ ඒ.ආර්. රහ්මාන්

වර්ෂ 1967 ජනවාරි මස 6 වන දින තමිල්නාඩුවේ චෙන්නායිහිදී උපත ලද මොහුගේ මුල්නම ඒ.එස්.දිලීප් කුමාර් විය. තම පියාගේ ශබ්දාගාරයේ දී Keyboard වාදකයකු ලෙස තම පියාට දායකත්වය ලබා දී ඇත. මොහුට අවුරුදු 9 දී මොහුගේ පියා මියගියේය. අවුරුදු 11 දී පමණ මාස්ටර් ධන්රාජ් නම් සංගීතඥයා යටතේ සංගීතය හදාරා එම්.කේ.අර්ජුන් සංගීතඥයාගේ සංගීත කණ්ඩායමේ වාදකයකු විය. වයස අවුරුදු 23 දී තම මවගේ ආගම වැළඳගත් ඔහු අල්ලා රක්බා රහ්මාන් ලෙස සංගීත ක්ෂේත්‍රයේ තවදුරටත් ඉදිරියට පැමිණියේය. රහ්මාන් ගීත රචකයෙකු, සංගීත නිර්මාණකරුවකු, සංගීත නිෂ්පාදකවරයෙකු, සංගීතඥයකු වේ. "Mozart of Madras" යන ආදර නාමයෙන් හඳුන්වන මෙතුමා පෙරදිග සංගීත සම්ප්‍රදාය නව electronic සංගීතය සමග මුසු කරමින් නව සංගීත නිර්මාණ බිහිකරන්නට සමතෙකි. "Roja" චිත්‍රපටයට ඔහු කළ සංගීත නිර්මාණය ඔහුගේ සංගීත නිර්මාණයේ විශිෂ්ඨත්වය විදහාපායි.

### ➢ උස්තාද් ශකීර් හුසේන්



වර්ෂ 1951 මාර්තු මස 9 දින ඉන්දියාවේ මහාරාෂ්ඨ ප්‍රදේශයේ මුම්බායි නගරයේදී උපත ලබා ඇත. තබ්ලා වාදකයෙකු මෙන්ම සංගීත නිෂ්පාදකයෙකු, නළුවකු වන මෙතුමා සංගීත පත (Music Track) නිර්මාණයේ ද දක්ෂතා ප්‍රදර්ශනය කල අයෙකි. භාරතයේ පද්ම ශ්‍රී සම්මාන "පද්ම භූෂණ" සම්මානය ද හිමිකර ගත් මොහු භාරතයේ අතිදක්ෂ තබ්ලා වාදකයෙකි. අවුරුදු 3 සිට පඛ්වාජ් වාදනය හුරුකළ මොහුගේ පියා අල්ලා රක්බා ද තබ්ලා වාදකයෙකි. තබ්ලාවෙන් ලොව වැඩිම සංගීත ප්‍රසංග පැවැත්වූ වාදකයා වන්නේ ද මෙතුමා ය.


## නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 1. “එන්ඩ ද මැණිකේ මමත් දියඹටා” යන ගීත ගයන ලද්දේ, | සුනිල් ශාන්ත ශූරීන් |
| 2. “ඕලු පිපීලා, මීහිකත නලවාලා” යන ගීත ගායනා කරන්නේ | උස්තාද් ශකීර් හුසේන් |
| 3. “දෙපාණෝ ගීත නාටකයත්, ගොයම් දා මඟුල, මාර පරාජය, - හෙළ ගී මග”, හි රචකයාණෝ; | සී.ද.එස්. කුලතිලක ශූරීන් |
| 4. “දැසමන් මලක් වගේ, සකිය සගව්වට” යන ගීතයන් සහ - ගම්මානයේ උපන් ගීත මොහුගේ නිර්මාණයකි. | ආනන්ද සමරකෝන් ශූරීන් |
| 5. “ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය” නම් ග්‍රන්ථය සම්පාදනය කළේ, | පණ්ඩිත් රවිශංකර් |
| 6. විසිවන සියවසයේ බිහි වූ ශ්‍රේෂ්ඨතම සිතාර් වාදනයට අතිදක්ෂයෙකි | රෝහණ බැද්දගේ ශූරීන් |
| 7. “ගසල් KING” යන විරුදාවලියෙන් නම් දරන්නෙකි | පණ්ඩිත හරිප්‍රසාද්චෞරසියා |
| 8. තබ්ලාවෙන් ලොව වැඩිම සංගීත ප්‍රසංග පැවැත්වූ වාදකයෙකි. | පණ්ඩිත් ජග්ජිත් සිං |
| 9. “බාන්සුරි” ඉන්දියන් බටනලා වාදනයේ අතිදක්ෂයෙකි | ලයනල් රංවල ශූරීන් |
| 10. “දෙපාණෝ” ගීත නාට්‍යයෙහි චරිතයට පන පෙවූ ජන සංගීත ආශ්‍රිත - ප්‍රසාංගික ගීත නිර්මාපකයෙකි. | සංගීතඥ ඒ.ආර්. රහුමාන් |
| 11. අතිදක්ෂ Key board වාදකයෙකු සේම Recording Artist කෙනෙකි. | ඩබ්.බී. මකුලොලුව ශූරීන් |

## නාද නිෂ්පත්තිය හා ප්‍රගමනය

- සංගීතයේ මාධ්‍යය වන්නේ, නාදය යි.නාදයෙන් ශ්‍රැති 22 ක් ද,එයින් ස්වර ද,ගොඩනැඟී ඇති බව භාරතීය සංගීතයේ සිද්ධාන්ත වල පැහැදිලි ය.
- හඬ මිහිරි හා අමිහිරි ලෙස කොටස් දෙකකි.
- මිහිරි හඬ නාද වේ.අමිහිරි හඬ ශබ්ද වේ.
- මිහිරි නාද සංගීත ස්වර වශයෙන් ගොඩනැගී ඇත.

| නාදය | ශබ්දය |
|---|---|
| නාද සමාකාර කම්පන වලින් යුක්ත ය | විෂමාකාර කම්පන වලින් යුක්ත ය |
| නිශ්චිත සංඛ්‍යාතයක් ඇත | නිශ්චිත සංඛ්‍යාතයක් නැත |



නාද තරංගයක්




ශබ්ද තරංගයක්



- නාදයක් උපදින්නේ වස්තුවක් කම්පනය වීමෙනි.
- තප්පරයක දී සිදු වන කම්පන වාර ගණන සංඛ්‍යාතයයි. එහි සංකේතය $H_Z$ වේ.
- විපුලතාවය,තාරතාවය,ධ්වනි ගුණය යනුවෙන් නාදයේ ප්‍රභේද තුනකි.
- **විපුලතාවය/රූපභේදය/Magnitude** යනු, හඬේ සැරයි.
- **තාරතාවය/උච්ච නීච-භේදය/Pitch** යනු, නාදයේ උස්,පහත් බවයි.
- **ධ්වනි ගුණය/ජාතිභේදය/Timbre** යනු, නාදයේ ත්‍රිවිධ ගුණයයි.

## <u>සප්තකයේ ස්වරයන්හි සංඛ්‍යාත</u>

| | ස | රි | ග | ම | ප | ධ | නි | ස |
|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යා විෂයේ දී සංඛ්‍යාතය | 256 | 288 | 320 | 340 | 384 | 426 | 480 | 512 |
| Concert pitch | 264 | 294 | 330 | 349 | 392 | 440 | 494 | 524 |
| | 261.63 | 293.66 | 329.63 | 349.23 | 392 | 440 | 493.88 | 523.25 |
| භාරතීය සංගීතයේ දී සංඛ්‍යාතය | 240 | 270 | 300 | 320 | 360 | 400 | 450 | 480 |




- **පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. සංගීතයේ මාධ්‍යය වන්නේ ...................................... යි.
2. කනට ඇසෙන මිහිරි හඬ ...................................... වේ.
3. සංගීතයේ දී ,නාද වන්නේ ................................... හඬ ය.
4. සංගීතයේ දී, ශබ්ද වන්නේ ................................... හඬය.
5.  මෙම රූප තරංගයෙන් නිරූපණය වන්නේ .............................. තරංගයකි.
6.  මෙම රූප තරංගයෙන් නිරූපණය වන්නේ ............................. තරංගයකි.
7. වස්තූන් දෙකක් එකිනෙකට ගැටී ඇතිවන ...................... කි.
8. සංඛ්‍යාතය මනිනු ලබන මිම්ම ...................................... වේ.
9. නාදයේ ත්‍රිවිධ ගුණ විද්‍යාවේ දී ......................... , .............................. ,......................... වේ.
10. නාදයේ ත්‍රිවිධ ගුණ ,සංගීතයේ දී ...................... , ............................ , ........................... වේ.
11. නාදයේ ත්‍රිවිධ ගුණ බටහිර සංගීතයේ දී ...................... , ........................ , ..................... වේ.
12. අඩු හඬකින් සහ වැඩි හඬකින් එකම ස්වරය ගායනය කිරීම ...................................... වේ.
13. තතක සණකම දිග අඩු වැඩිකමින් නාදයේ ........................ බව ඇති වේ.
14. එකම ස්වර සංගීත භාණ්ඩ වර්ග දෙකකින් වාදනය කළ විට ඇති වන්නේ ...................... යි.
15. සප්තකයේ ස්වරයන්හි සංඛ්‍යාතයට අනුව 384 $H_z$ යනු ...................................... ස්වරයයි.

## උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණයේ රාගධාරී පසුබිම

උතුරු ඉන්දීය බොහෝ චිත්‍රපටවල සංගීත නිර්මාණයට රාගධාරී පසුබිම මුසුකොට ඇත. එය පැරණිතම චිත්‍රපටවලින් මනාව පෙනේ. පසුගිය වකවානුවේ ඉන්දියාව පුරාමත් ශ්‍රී ලංකාවෙත් ඉතා ජනප්‍රිය වූ දක්ෂතම නිර්මාණ කරුවෙකු වූ සත්‍යජිත් රායි නම් නිර්මාණකරුවාගේ "මදර් ඉන්ඩියා, පාතර්පංචාලි" වැනි චිත්‍රපටවල සංගීත නිර්මාණය දක්ෂතම භාරතීය සංගීතඥයෙකු වූ රවිශංකර් පඬිතුමා අතින් නිර්මිත වූ නිසා උත්තර භාරතීය රාගධාරී සංගීතය පසුබිම් වී ඇත.

1950 දශකයේ නිර්මිත බොහෝ චිත්‍රපටවල සංගීතය රාගධාරී පසුබිමකින් නිර්මාණය විය. එය මෙසේ විමසා බලමු.

- කොහිනූර්, බෛජුබව්රා, ජනක් ජනක් පායල් භාජේ, මධුමති, චිත්‍රපටවල රාගධාරී පසුබිම ඇත.

- මොහොමඩ් රාෆි, මන්නාඩේ, ලතා මංගේෂ්කාර්, ආශා බොෂ්ලේ, අශෝක්කුමාර්, බිම්සන් ජෝෂි, ලලිතා පඩ්කේ, ඩී.වී.පලුෂ්කාර්, උස්තාද් පයේ අලිඛාන්, උස්තාද් අමීර්ඛාන්, උස්තාද් බඩේ ගුලාම් අමීර්ඛාන්, වැනි ගීත ගායනා කල ශාස්ත්‍රීය ගායක - ගායිකාවන් අතරින් කිහිප දෙනෙකි.

- එම උතුරු ඉන්දීය චිත්‍රපටවල සංගීත නිර්මාණකරුවන් අතරින් කිහිප දෙනෙක් ලෙස නෞෂාඩ් අලි, ශංකර් ජායිකිෂන්, සි.රාමචන්ද්‍ර, පණ්ඩිත් රවිශංකර්, එස්.ඩී.බර්මන්, හේමන්ත කුමාර්, ඕ.පි.නයියාර්, ලක්ෂ්මිකාන්ත් ප්‍යාරීලාල්, යන අය දැක්විය හැක.

- එම චිත්‍රපට සඳහා පදනම් කරගත් රාග අතරින් යමන්, දර්බාරිකාණඩා, පීලු, ආශාවරි, ජෞනපූරි, හමීර්, කේදාර්, භාගේශ්‍රී, භීමපලාසි, භෛරවී, භූපාලි, මධුවන්ති, ජයජයවන්ති, කලාවතී, යන රාග දැක්විය හැක.

- එවැනි හින්දි චිත්‍රපට ගීත අතරින් රාගධාරී පසුබිම ඇති ගීත සමහරක් සිංහලයට අනුවර්තනය වී ඇත. සමහර සිංහල ගීත හින්දි ගීතයටත් වඩා රමණීය ලෙස නිර්මාණය වී ඇත. නිදසුන් ලෙස,

| | |
|---|---|
| තෝරා මන සර පන කෙහෙලායේ | - දර්බාරිකාණඩා රාගය |
| මම දෙව්දුනි දෙවොලට ආවේ | - ගායනය සුජාතා අත්තනායක |
| | |
| හෝ දුනියා කේ රබ වාලේ | - දර්බාරිකාණඩා රාගය |
| කෝ සපතා මේ සංසාරේ | - ගායනය අල්හාජ් මොහිදීන් බෙග්, |

(හින්දි චිත්‍රපට ගීතවලට රාගධාරී පසුබිම පිලිබඳ විස්තර හැදෑරීමට කැමති පුද්ගලයන්ට පහත දැක්වෙන වෙබ් අඩවිවලින් ඒ සඳහා විස්තර ලබාගත හැකිය.)

http://www.indianpicks.com/SNT_Hindi/Raga_Index.htm
http://hindigeethmala.net/movie/........htm

➢ **නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| (1) උතුරු ඉන්දීය බොහෝ චිත්‍රපට වල සංගීත නිර්මාණයට පාදක වී ඇත්තේ | අභිමාන් |
| (2) සත්‍යජිත් රායි, රවිශංකර් පඬිවරුන් විසින් නිර්මිත චිත්‍රපටයකි. | Introduction, Interludes Counters සහ විවිධ සංගීත භාණ්ඩ |
| (3) භාරතීය චිත්‍රපට වල රාගධාරී පසුබිම බෙහෙවින් දැකිය හැකි දශකයකි. | භෛරවී |
| (4) "තු ගංගා කි මෝජුමෙ" යන හින්දි චිත්‍රපටයට පාදක වූ රාගය | උත්තර භාරතීය සංගීතය |
| (5) "මෝසම් හෙ" යන හින්දි චිත්‍රපටයට පාදක වූ රාගය | භෛරවී |
| (6) "තෙරේ මේරේ මිලන් කී" යන හින්දි චිට්රපටයට පාදක වූ රාගය | 1950 |
| (7) "මේරේ මන්කී ගංගා" යන හින්දි චිත්‍රපටයට පාදක වූ රාගය | ඛමාජ් |
| (8) මොහොමඩ් රාෆි ගායනය කරන "තු ගංගා කී මෝජුමෙ " යන ගීතය ඇතුළත් චිත්‍රපටය | පාතර් පංචලි,මදර් ඉන්දියා |
| (9) හින්දි චිත්‍රපට සංගීත නිර්මාණයේ දී වැදගත් කරුණක් වන්නේ | බෛජු බව්රා |
| (10) "කිෂෝර් කුමාර්, ලතා මංගේෂ්කර්" ගායනය කරන "තෙරේ මේරේ" යන ගීතය ඇතුළත් චිත්‍රපටය | යමන් |

# ගී පද නිර්මාණය සහ තනුවක් ගොඩනැගීම

- තම සිතට එන අදහස් ගලපා ගීතයක් නිර්මාණය කරමු.
- එය යම්කිසි රිද්මයකට පෙළගස්වමු.
- මාත්‍රා 2න් 2 ට, මාත්‍රා 3න් 3 ට , මාත්‍රා 4න් 4 ට හෝ යම් රිද්මයකට ගීතය ගොඩනැගී ඇත්දැයි විමසා බලමු.
- ආධුනිකයෙකු තනුවක් නිර්මාණය කිරීමේදී යම් රාගයකට ආවේනිකව නිර්මාණය කිරීම මූලික අඩිතාලම ලෙස යොදාගත හැක.

**උදාහරණ**

- යමන් - ශාන්ත රස - භක්ති ගීත / මව් පිය ගුණ ගීත නිර්මාණය කළ හැක.
- භූපාලි - වීර රස - විනෝද ළමා ගීත / දේශාභිමානී ගීත නිර්මාණය කළ හැක.

## කවියක් ගීතයක් වන අයුරු

- ඕනෑම ගීතයක් කවියක් වේ. එහෙත් ඕනෑම කවියක් ගීතයක් නොවේ. මේ අදහස රවින්ද්‍රනාත් තාගෝර්තුමා ගෙනි.
- එස්. මහින්ද හිමියන්ගේ කුමාරතුංග මුනිදාසයන්ගේ පද්‍ය රචනා ගීත ලෙස ජනප්‍රිය වී ඇත.

**උදාහරණ**

- තොටිල්ලෙ සැම සුව පිරී
- සඳ පානේ වැලි තලා

- නූතන සරල ගී ක්ෂේත්‍රය තුල දැකිය හැකි ගීත රාශියකි.
- සුවිශේෂී ශිල්පක්‍රම භාවිතා කරමින් මිහිර ලෙස ගායනා කර ඇති මෙම ගීත විමසා බලමු.

**උදාහරණ**

- දුනුකෙයියා මලක් වගේ ... දුරට පෙනෙනවා .... - ගායනය - සුජාතා අත්තනායක
- කඳුළු හෙලා නාම්බිලියට සහල් ගරන අම්මා ... - ගායනය - දීපිකා ප්‍රියදර්ශනී
- අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී ..... - ගායනය - ටී.එම්. ජයරත්න
- ලක් වැසියන් කෙරෙහි නැමී ..... - ගායනය - සුනිල් එදිරිසිංහ
- උපන්නේ පුතෙක් වී ..... - ගායනය - සුදත් සමරසිංහ
- රූ රැසේ අඳිනා ලෙසේ .... - ගායනය - සුසිල් ප්‍රේමරත්න

## දෙබස් ගීතයකට යොදාගන්නා අයුරු

- දෙබස් යොදා ගනිමින් ගී නිර්මාණයට පෙළඹී ඇති බව ජන ගී ඉතිහාසයෙන් අනාවරණය වේ.

**උදාහරණ**

- කෙළි ගී - එළුවන් කැම - මේ වැල මොකදෝ --- දම්වැල
- ඔලිඳ කෙළිය - ඔලිඳ තිබෙන්නේ කොයි කොයි දේ සේ

- නාට්‍ය

**උදාහරණ**

- නරිබෑණා

- ව්‍යවහාරික සංගීතය

**උදාහරණ**

- මොනවාද මුත්තේ මොකද කරන්නේ ....
- මොනවාද අම්මේ අකුරු ජාතියක්....
- බුදුන් වදින මේ දෑතින්...

## නිවැරදි පිළිතුර වරහනින් තෝරා ලියන්න.

1. පද මාලාවේ අර්ථයට ගැළපෙන සේ රිද්මය හා ස්වර (යොදා ගත යුතුයි/යොදා නොගත යුතුයි)
2. ගීතයක් අංගසම්පූර්ණ වීම සඳහා පෙරවාදන,අතුරුවාදන,අන්තරා,විචිත්‍රවත් කෙටි ස්වර ඛණ්ඩ (අත්‍යවශ්‍ය වේ/අත්‍යවශ්‍ය නොවේ)
3. ළමා ගීතයක් නිර්මානයේදී සැලකිය යුතුම කරුණක් වන්නේ ....(සරල බව / සංකීර්ණ බව) ය.
4. තනු නිර්මාණය පහසු කරවන්නකි. (ගායනය/වාද්‍ය භාණ්ඩ භාවිතය)
5. තනු නිර්මාණය කිරීමට ස්වර ඥානය (වැදගත් වේ/වැදගත් නොවේ)
6. තනුවක් නිර්මාණයේ දී පද මාලාවට ගැලපෙන සේ රිද්මය යොදා ගැනීම (සාර්ථකය/අසාර්ථකය).
7. ප්‍රස්තුතාර්ථය නාද මාලාවකට (වැදගත් වේ/වැදගත් නොවේ)
8. “ඕනෑම ගීතයක් කවියක් වේ.එහෙත් ඕනෑම කවියක් ගීතයක් නොවේ.” මෙම අදහස (රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ /සාරංගදේවගේ) ය.
9. “දුනු කෙයියා මලක් වගේ” යන ගීතය ගායන කරන්නේ, (දීපිකා ප්‍රියදර්ශනී/සුජාතා අත්තනායක) මහත්මිය ය.
10. “කඳුලු හෙලා නැබිලියට සහල් ගරන අම්මා” යන ගීතය ගායනා කරන්නේ, (සමිතා මුදුන්කොටුව/දීපිකා ප්‍රියදර්ශනී) මහත්මිය ය.
11. “අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී” ගීතය ගායනය කරන්නේ,(එඩ්වඩ් ජයකොඩි/ටී.එම්.ජයරත්න) මහත්මයා ය.
12. “ලක්වැසියන් කෙරෙහි නැමී” යන ගීතය ගායනය කරන්නේ(සුනිල් එදිරිසිංහ/සුදත් සමරසිංහ) මහත්මයා ය.
13. ගීතවත්ව දෙබස් ඉදිරිපත් කරන ගැමි ගී ගායනයකි. (ගොයම් ගී/කෙළි ගී)
14. රබන් පද නාද රටා සහ රිද්ම රටා යොදා නිර්මාණය කළ නාට්‍යයකි. (මනමේ/නරිබෑනා)
15. මෑත යුගයේ ගීතවත් දෙබස් ලෙස යොදා ගත් නාට්‍යයකි. (හත්පණ/නෛයිනගෙ සුදුව)
16. “එන්ඩ ද මැණිකේ මමත් දියබටා” යන ගීතය ගායනා කරන්නේ, (සුනිල් ශාන්ත ශූරීන්/ආනන්ද සමරකෝන් ශූරින්) ය.
17. “බුදුන් වඳින මේ දෑතින් වැදලා කියන්නම් අම්මේ” යන ගීතය ගායනා කරන්නේ, (අනුලා බුලත්සිංහල/නන්දා මාලනී) මහත්මිය ය.
18. තනුවක් නිර්මාණය කිරීම සඳහා පහසු වාද්‍ය භාණ්ඩයකි. (තබ්ලාව/හාමෝනියම්)
19. “සෙම්පතියන් ගැන නැවුපතියන්” ගැන යන ගීතය ගායනා කරන්නේ (පුලස්ති ඉන්දික රණතුංග/හර්ෂන දිසානායක) ය.
20. නරිබෑනා නාට්‍යයෙහි සංගීත අධ්‍යක්ෂණය (ලයනල් අල්ගම/දයානන්ද ගුණවර්ධන) ශූරින් ය.

# නව නාට්‍ය ගී සඳහා නාඩගම් ආභාෂය ලැබීම

## නාඩගම් නාට්‍ය ශෛලිය

ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල රඟදැක් වූ නාට්‍ය සම්ප්‍රදායක් ලෙස නාඩගම් නාට්‍ය හැඳින්විය හැක. දකුණු ඉන්දීය ද්‍රවිඩ නාට්‍ය සම්ප්‍රදායක් අනුගමනය කරමින් සකස් වූ නාට්‍ය ශෛලියකි. පස්ගොඩ කර සැකසූ එළිමහන් ස්ථානවල රඟ දැක්විය. එම ස්ථානය කරලිය නමින් හඳුන්වයි. එකම කතා පුවත රාත්‍රී කාලයේ දින කිහිපයක් තුළ රඟ දැක්විය. කථාව අතරතුර පොතේ ගුරු චරිතය කථාව විස්තර කරමින් ඉදිරිපත් කිරීම මෙම නාට්‍ය ශෛලියේ විශේෂ ලක්ෂණයකි. නාඩගම්වලට පොදු වූ චරිත ලෙස බහුබූතයා, පොතේ ගුරු, සෙල්ලම් ළමා වැනි චරිත හඳුන්වා දිය හැක.

නාඩගම් නාට්‍ය සම්ප්‍රදායේ එන ගෝ තනු සඳහා කර්ණාටක සංගීතය බෙහෙවින් බලපා ඇත. නාඩගම් ගී ශෛලියේ එන සුවිශේෂී අංග වන උරුට්ටුව, ඉන්නිසය, තෝඩායම යන කොටස් තුළ ද ගැබ් වී ඇත්තේ කර්ණාටක සංගීත ලක්ෂණයි.

එසේම ගී තනු වාදනයේ දී තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදාගෙන ඇත්තේ මද්දලයයි. මද්දල දෙකක් යොදා ගනිමින් අඩුතාල් සහ වැඩිතාල් වාදනය නාඩගම් සංගීතයේ තවත් ලක්ෂණයකි. ඒ සඳහා යොදා ගන්නා තාල අතර පසන්, තිර්ලානා, චාපු, කිර්තනම් වැනි තාල ද කර්ණාටක රාග ද ඇසුරු කරගෙන ඇත. ගීත ගායනය අතරතුර ගීත පාදයේ ඇද පැද ලෙළවා යති යෙදීම එනම් අගහාරං යන ලක්ෂණයද සුවිශේෂී වේ. නාදරටා තරමක් සංකීර්ණ ස්වභාවයක් ගනී. ස්වර වාදනයට සර්පිනාව සහ හොරනාවද භාවිතා කර ගනී. විශේෂය වූ සභය ගායන වෘන්දයක් මගින් ගීයේ යම් යම් කොටස් පුනර් ගායනය ද මෙහි තවත් සංගීතමය ලක්ෂණයකි. සියලු සංවාද ද ගායනා ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම ද සුවිශේෂත්වයකි.

## නව නාට්‍ය සම්ප්‍රදාය

- නව නාට්‍ය සම්ප්‍රදාය නිර්මාණය කිරීමේ පුරෝගාමියා ලෙස හඳුන්වනු ලබන්නේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ශූරින් ය.
- මෙතුමා විසින් පැරණි නාඩගම් සම්ප්‍රදාය ඇසුරින් නිර්මාණය කරන ලද පළමු නව නාට්‍ය ලෙස හඳුන්වනු ලබන්නේ මනමේ, සිංහබාහු යන නාට්‍යයි.
- මෙම නව නාට්‍ය ශෛලිගත නාට්‍ය සහ අර්ධ ශෛලිගත නාට්‍ය වශයෙන් ප්‍රධාන කොටස් 2 කට වෙන්කර ඇත.
- 1956 වර්ෂය මෙම නාට්‍ය සම්ප්‍රදාය නිර්මාණය වීමේ මූලික සන්දිස්ථානයක් වූ වර්ෂය ලෙස හැඳින්විය හැක.
- මෙම නාට්‍ය තුළ දෙබස්, ගීත නළු නිලියන් විසින් ම ඉදිරිපත් කරනු ලබයි.
- නව නාට්‍ය ගීත සඳහා පසුබිම් සංගීතය ද යොදාගෙන ඇත.
- මෙහි දී නාට්‍ය නිෂ්පාදකවරයා සහ සංගීත අධ්‍යක්ෂකවරයා ප්‍රධාන තැනක් ගෙන කටයුතු කරයි.
- අද වන විට මෙම නව නාට්‍ය සම්ප්‍රදාය තුළින් සමාජය ආදර්ශමත් සුවිශේෂී මෙහෙවරක යෙදෙමින් දිගු කාලීන ගමන් මගම යාමට කටයුතු කර ඇත.

**නාඩගම් ගී තනු නව නාට්‍ය සඳහා පාදක කරගත් අයුරු ගී තුලින් හඳුනා ගනිමු.**

| පැරණි නාඩගම් ගීතය | ඒ අනුව නිර්මිත නව නාට්‍ය ගී |
|---|---|
| දුල් නිමල් සිසි සේ - ඉයුජින් | නන් සිරින් වොරැදි - මනමේ |
| ගගන රිවි සොමි - ඇහැළේපොළ | ඉර සඳ දෙවියනි - මනමේ |
| පවර පසිඳු - බ්‍රම්පෝඩ් | ලප නොමවන් සඳ - මනමේ |
| ශබ්දාන්ත නක්ෂත්‍ර - ඇහැළේපොළ | උදුල කරවන - මනමේ |
| සත් වෙත සෙත් දෙන - බ්‍රම්පෝඩ් | සත් හට සෙත් දෙන - මනමේ |
| මෙමගින් ගිය - ඉයුජින් | රුසිරු ළඳුනි - මනමේ |
| ලෝ පසිඳු - බ්‍රම්පෝඩ් | සේ සුරිඳු- මනමේ |
| පින් සරු ධීරා - වෙස්සන්තර | දස දෙස ඉන්ද්‍රා - සිංහබාහු |
| යානක අතුල මල් පෙති - ඉයුජින් | බුදු තුල් ගුණැති - සිංහබාහු |
| ශ්‍රී සාර චන්ද්‍ර - ඉයුජින් | හෙණයක් සේ පතිත - සිංහබාහු |
| රශ්මි ප්‍රභූත වූ - ඇහැළේපොළ | ඇන්දූ දිගංගන - සිංහබාහු |

පහත සඳහන් නව නාට්‍ය පිලිබඳ කරුණු විමසා බලමු.

**<u>මනමේ නාට්‍ය</u>**

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ශූරින් විසින් 1956 නොවැම්බර් මස 3 වන දින කොළඹ ලයනල් වෙන්ට් රඟහලේ දී එළි දක්වන ලදී. චූල්ල ධනුග්ග ජාතක කතාව පාදක වුවකි. චූල්ල ධනුග්ග ඇදුරිඳුගේ දෙටු දියණිය, වැදී රජු මෙහි ප්‍රධාන චරිත වේ.




පැරණි නාඩගම් ගුරුන්නාන්සේ කෙනෙකු වූ චාර්ල්ස් සිල්වා ගුණසිංහ මහතා පැරණි නාඩගම් ගී තනු හා ශෛලියගත රංග ක්‍රම එදිරිවීර සරච්චන්ද්‍රයන් හට නොමසුරුව පරිත්‍යාග කළේය. සිරිගුණසිංහ මහතා රංග වස්ත්‍රාභරණ හා අංග රචනයෙන් දායක විය. ඉතා ප්‍රබුද්ධ නළු නිලියන් රාශියකගේ දායකත්වය නිසා විශිෂ්ඨ ගනයේ නිර්මාණයක් වී ය. මනමේ නාට්‍යයේ එන ජනප්‍රිය ගීත ලෙස "ප්‍රේමයෙන් මන රංජිත වේ, ලප නොමවන් සඳසේ සොමි ගුණෙනා, මේ අරණේ" යන ගීත දැක්විය හැක.

## සිංහබාහු



මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් 1961 සැප්තැම්බර් මස පේරාදෙණියේ අභිනව එළිමහන් රංග පියයේ වේදිකා ගත කරන ලදී. සිංහබාහු, සිංහයා, සුප්පාදේවි, සිංහ සීවලී, යන චරිත ප්‍රධාන තැනක් ගනී. තනු නිර්මාණයෙන් එච්.එම්. බණ්ඩාරයන් දායක වූ අතර මද්දල් වාදනය අම්පේ නෝමන් ගුණසිංහ ශූරින් විසින් වාදනය කරන ලදී. වෙස් නිර්මාණය දියගම විමලධර්මයන් විසින් කරන ලදී.

සිංහයාගේ චරිතයේ තම අඹුදරුවන් කෙරෙහි ඇති සෙනෙහස පිළිඹිඹු වන ගීතයකි "තැන් තැන් වල ම ලැගී - සන්නන් මුවන් රළ". ජනප්‍රිය ගී ලෙස " වගුරට නරනිඳු - ගල්ලෙන බිඳලා" යන ගීත දැක්විය හැක.

## කාලගෝල




අම්පේ චාල්ස් ද සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේගේ බාලම පුත්‍රයා වූ පුන්‍යසේන ගුණසිංහ මෙම දිත්තල කාලගෝල නාට්‍යයේ නව නිෂ්පාදකවරයා විය.

පාදක වී ඇති කතාව උම්මග්ග ජාතකයයි. කාල වර්ණ, මිටි අඟුටුමිට්ටකු හා රූමත් අඟනක වූ දිත්තල නම් චරිත ප්‍රධාන ව ගලායන නාට්‍යයකි.

ජනප්‍රිය ගීත ලෙස "රතඳර සිරියා, ඇන්නැවේ මළ කෝලම්, ආලේ බැන්ද මාගේ රම්‍යවන්, මැ වේ මා දුටු කොමළ ලියා" යන දැක්විය හැක.

**පහත සදහන් වැකි හරි නම් “✓” ලකුණ ද, වැරදි නම් “✗” ලකුණ ද, යොදා නිවැරදි පිළිතුර පහත වරහන් තුළින් තෝරා ලියන්න.**

1. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ආශ්‍රිත ගැමි නාට්‍යයක් වන්නේ සොකරි ය. ( ) ..........................
2. නාඩගම් චරිත ලෙස බහුබූතයා,පොතේ ගුරු,සෙල්ලම් ළමා හැඳින්විය හැක. ( ) ............................
3. නාඩගම් නාට්‍ය සඳහා උත්තර භාරතීය සංගීතය බලපා ඇත. ( ) .............................
4. උරුට්ටුව,ඉන්නිසිය,තෝඩායම නාඩගම් වල සුවිශේෂී අංග කිහිපයකි. ( ) .............................
5. නාඩගම් සඳහා යොදා ගත් තාලවාද්‍ය භාණ්ඩය වන්නේ තබ්ලාවයි.( ) ...........................
6. දාදරා,ත්‍රිතාල්,දිප්චන්දී යනු නාඩගම් තාල වේ. ( ) ..........................
7. සර්පිනාව,හොරණෑව යනු නාඩගම් සඳහා යොදා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයන් ය. ( ) .........................
8. නව නාට්‍යයෙහි දක්නට ලැබෙන “පුනර් ගායනය” නාඩගම් නාට්‍ය තුළින් පැමිණියකි. ( ) .........................
9. නව නාට්‍යය සාම්ප්‍රදායේ පුරෝගාමියා “එදිරිවීර සරත්චන්ද්‍ර” ශූරීන් ය. ( ) ..............................
10. පැරණි නාඩගම් ඇසුරින් නිර්මාණය කළ නව නාට්‍යය මනමේ, සිංහබාහු ය. ( ) ..................................
11. නව නාට්‍යය ශෛලිය, ශෛලියගත හා අර්ධ ශෛලියගත යනුවෙන් කොටස් දෙකකි. ( ) ..........................
12. නව නාට්‍යය ප්‍රවේශ වූ වර්ෂය ලෙස 1948 වර්ෂය හැඳින්විය හැක. ( ) ..............................
13. “මෑ වේ මාදුටු කොමළ ලියා” යන කාලගෝල නාට්‍ය ගීතයට බලපෑවේ “වෙස්සන්තර නාඩගමේ” එන “ඒ බුදු බව පතමින ලොබිනේ” යන ගීතයයි. ( ) ............................
14. “දූල් නිමල් සිසි සේ දිසි” යන ඉයුජීම් නාඩගමේ ගීතය සිංහබාහු නව නාට්‍ය සඳහා පාදක කර ඇත. ( ) ............
15. බ්‍රම්පෝඩ් නාඩගමේ එන “ලෝ පසිඳු තුනු” යන ගීතයට යොදා ගත් තාලය කීර්තනම් ය. ( ) .......................